*සැ.යු.*- 2019.03.15 දින පළවූ අංක 2115 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවී ය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,116 - 2019 මාර්තු මස 22 වැනි සිකුරාදා - 2019.03.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 822 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 841 |


*සැ. යු.*-(i) සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත 2019 පෙබරවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අප්‍රේල් මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මාර්තු මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


819 - B 81506 — 5,403 (2019/03)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ග යෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු — අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 අප්‍රේල් මස 22 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 පෙබරවාරි මස 28 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුරය | කහටගස්දිගිලිය | උතුරු උඩියන්කුලම කෝරළය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා හුරුළු පළාත කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය. |

03-917

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු — මඩකලපුව දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතුය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 අප්‍රේල් මස 22 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 පෙබරවාරි මස 27 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මඩකලපුව | එරාවූර් පත්තු | ආරුමුගත්තාන් කුඩියිරුප්පු කොට්ඨාසයේ උප්පැන්න මරණ හා එරාවූර් කෝරලයිපත්තු කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව. |
| මඩකලපුව | මන්මුනේපත්තු (ආරයම්පදි) | ආරයම්පදි කොට්ඨාසයේ උප්පැන්න මරණ හා මන්මුනේපත්තු කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව. |
| මඩකලපුව | එරාවූර් පත්තු | රුගම් කොට්ඨාසයේ උප්පැන්න හා මරණ හා එරාවූර් පත්තු කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව. |

03-915

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 අප්‍රේල් මස 22 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 මාර්තු මස 01 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | ඉබ්බාගමුව | හිරියාල හත්පත්තුව කොට්ඨාසයේ මැල්සිරිපුර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | ඉබ්බාගමුව | හිරියාල හත්පත්තුව කොට්ඨාසයේ ඉබ්බාගමුව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

03-919

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු — ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 අප්‍රේල් මස 22 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 පෙබරවාරි මස 27 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | මූතූර් | කොඩ්ඩියාර් දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |

03-916

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන්ගේ අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 අප්‍රේල් මස 22 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 පෙබරවාරි මස 27 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | කුච්චවේලි | කුච්චවේලි කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |
| ත්‍රිකුණාමලය | මූතූර් | තෝප්පූර් කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය |

03-914

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 අප්‍රේල් මස 22 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 පෙබරවාරි මස 28 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුරය | කැකිරාව | කළාගම් පළාත කොට්ඨාසයේ මඩාටුගම ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය |

03-918

## ශ්‍රී ලංකා පොලීසිය

### පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලිසියේ ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් ''අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06,'' යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2019.05.22 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි 11 වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය.

තවද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (*අ*) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (*ආ*) | රා. ප. ච. 03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව | රු. 10,595 0 |
| (*ඇ*) | දුෂ්කර දීමනාව | රු. 2,000 0 |
| (*ඈ*) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250 0 |
| (*ඉ*) | සංයුක්ත දීමනා | රු. 10,500 (350 x 30 විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා) |
| (*ඊ*) | සංයුක්ත දීමනා | රු. 8,400 00 (350 x 24 විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා) |

මෙම දීමනාවලට අමතරව -

(*අ*) නොමිලේ ගමන් පහසුකම්,

(*ආ*) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(*ඇ*) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(*ඈ*) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(*ඉ*) රාජකාරි සඳහා ගමන් වියදම් ද, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(*අ*) *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය. එසේ වුවද දැනට ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරියේ නියුතු පොලිස් කොස්තාපල් රියදුරන්ට අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැකිය.

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම්* :

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේදී විෂයයන් 05ක් සමත් විය යුතුය. (විෂයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය.)

*සටහන 01.*- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් ලෙස ද, සලකා විභාග යෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02.*- අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03.*- වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(*ඇ*) *ශාරීරික සුදුසුකම්* :

- උස අඩි 05 යි. අඟල් 04 යි. (අවම),
- පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

*සටහන* .- විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා මූලික සුදුසුකම් ලබයි.

(*ඈ*) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් .*— එක් ඇසක දෘෂ්ටිය 6/12ට අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ

අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කරුවෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙකුත් සුදුසුකම්* :

අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරන පොලිස් කොස්තාපල් රියදුරන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

- අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තුදීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණය සමත් විය යුතු ය.

  මීටර් 1000 - මිනිත්තු 03 තත්පර 44

- යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

  ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

  - වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.—කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතුය.
  - සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.—කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :

අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරාගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණය පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරියා විසින් වෛද්‍ය පරීක්ෂණයේ වාර්තා සංඛ්‍යා 169 පෝරමය යටතේ ඉදිරිපත් කරන අතර වෛද්‍ය පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි.

07. *පසුබිම් පරීක්ෂණය* :

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරුකර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද, යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතුය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්වීතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.
- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරින්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :

මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

10. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) බඳවා ගනුලබන නිළධාරීන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, පොලිස් නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙක්ම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්‍ෂණවලින් සමත් විය යුතුවේ. එම පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන්ට පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතුන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන් සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලිසියේ අනුමත උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

2019 මාර්තු මස 05 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

ආදර්ශ අයදුම්පත්‍රය

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා 2" x 2 1/2" ප්‍රමාණය |
|---|

**ශ්‍රී ලංකා පොලීසිය**

***ආධුනික පොලිස් කොස්තාපල් තනතුර***

01. (*අ*) සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදි ම විය යුතුය.

(*ආ*) නම (මුලකුරු සමග) :————.

(*ඇ*) අයදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කරු උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
පළාත :————.

05. (*අ*) වර්තමාන ලිපිනය :————.
(*ආ*) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(*ඇ*) ස්ථිර ලිපිනය :————.
(*ඈ*) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(*ඉ*) ලිපි හුවමාරු කළ යුතු ලිපිනය :————.
(*ඊ*) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(*උ*) දුරකතන අංකය : නිවස :————. ජංගම :————.

06. (*අ*) ජන වර්ගය :————.

(*ආ*) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(*ඇ*) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.
* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (*උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි*)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————.

පපුව : අඟල් :————.

09. *අධ්‍යාපන සුදුසුකම්* : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :————.

10. අතිරේක සුදුසුකම් :————. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :————.

12. (*අ*) දැනට කරන රැකියාව :————.

(*ආ*) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :————.

14. ඔබ ගැන විමසුම් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් (ඥාතීන් නොවන) :

(*අ*) ————.

(*ආ*) ————.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිසියේ, සේවය කර තිබේ ද ? :————.

තනතුර සහ නිල අංකය :————.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :————.

16. (*අ*) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(*ආ*) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

17. (*අ*) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(*ආ*) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇත්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලිසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

20. *ආයතන ප්‍රධානියාගේ සහතිකය* : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මයා/ .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.

දිනය :———.

03-1111/1

---

## ශ්‍රී ලංකා පොලීසිය

### කාන්තා පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලිසියේ ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2019.05.22 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර, ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

2016.01.01 වැනි දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි 11 වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 වැනි දින සිටය.

තව ද මෙම නිලධාරිනියන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත. :

(අ) ජීවන වියදම් දීමනාව — රු. 7,800 0
(ආ) රා. ප. ච. 03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව — රු. 10,595 0
(ඇ) දුෂ්කර දීමනාව — රු. 2,000 0
(ඈ) නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා — රු. 250 0
(ඉ) සංයුක්ත දීමනා — රු. 10,500 0 (රු. 350 x 30 විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා)
(ඊ) සංයුක්ත දීමනා — රු. 8,400 0 (රු. 350 x 24 විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා)

මෙම දීමනාවලට අමතරව -

(අ) නොමිලේ ගමන් පහසුකම්,

(ආ) නිලධාරිනියන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් 06ක් සමත් විය යුතු ය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂිකාවක් ප්‍රථම වාරයේ දී විෂයන් 05ක් සමත් විය යුතුය. (විෂයන් 05 ඇතුළත ගණිතය හෝ

මාධ්‍ය භාෂාව යන විෂයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය.)

සටහන 01: ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් ලෙස ද, සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

සටහන 02 : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

සටහන 03: වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම්* :

- උස අඩි 05 යි, අඟල් 02 යි. (අවම),

*සටහන.-* විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කාරියකගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා මූලික සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් .*— එක් ඇසක දෘෂ්ටිය 6/12ට අඩු නොවිය යුතුය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අයදුම්කාරියක් උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙකුත් සුදුසුකම්* :

* අයදුම්කාරිය අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.)

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

- අයදුම්පත් අනුව මූලික සුදුසුකම් ලබන අයදුම්කාරියන් ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තුදීමේ පරීක්ෂණය එනම්, දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

මීටර් 1000 - මිනිත්තු 05 තත්පර 14

- යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කාරියන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

  ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

  - වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.—කාලය විනාඩි 45 යි. වචන 500කට නොඅඩු විය යුතුය.
  - සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.— කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :

- අයදුම්කාරියන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්‍ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්‍ෂණයෙන් සමත් වූ අයදුම්කාරියන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්‍ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වෛද්‍ය පරීක්‍ෂණය පොලිස් රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරිය විසින් වෛද්‍ය පරීක්‍ෂණයේ වාර්තා සෞඛ්‍ය 169 පෝරමය යටතේ ඉදිරිපත් කරන අතර වෛද්‍ය පරීක්‍ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි.

07. *පසුබිම් පරීක්ෂණය* :

(අ) අයදුම්කාරියන්ගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඇය හා ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඇය ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතුය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට

පහළ තනතුරු දරන නිලධාරිනියන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්/නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :

- මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) බඳවා ගනු ලබන නිලධාරිනියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද, මුදල් රෙගුලාසි, පොලිස් නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතුය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරිනියක්ම ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරිනියන්ට පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කාරියන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කළ යුතු වන අතර, මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඇයගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතුය.

(උ) ආධුනික/කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(ඌ) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතුය.

(එ) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන් සේවය ස්ථිර කිරීමෙන් පසුව, ශ්‍රී ලංකා පොලීසියේ අනුමත උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපිලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කාරිය තෝරා ගන්නා ලද්දේ

නම් ඇය නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතු ය.

(ආ) අයදුම්කාරිය විසින් අයදුම්පත් අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර, අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර, කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කාරියන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

2019 මාර්තු මස 05 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**ආදර්ශ අයදුම්පත්‍රය**

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා 2" x 2 1/2" ප්‍රමාණය |
|---|

***ශ්‍රී ලංකා පොලීසිය***

*ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර*

01. (අ) සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.

(ආ) නම (මුලකුරු සමග) :————.

(ඇ) අයදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කාරිය උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ලිපි හුවමාරු කළ යුතු ලිපිනය :————.
(ඊ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(උ) දුරකථන අංක : නිවස :————. ජංගම :————.

06. (අ) ජන වර්ගය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.
* අයදුම්කාරිය :————.
* අයදුම්කාරියගේ පියා :————.
* අයදුම්කාරියගේ පිය පාර්ශවයේ මුත්තා :————.
* අයදුම්කාරියගේ පිය පාර්ශවයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :————.

10. අතිරේක සුදුසුකම් :————. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :————.

12. (අ) දැනට කරන රැකියාව :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකාවක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :————.

14. අයදුම්කාරිය ගැන විමසුම් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

(අ) ————.

(ආ) ————.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ සේවය කර තිබේ ද ? :————.

තනතුර සහ නිල අංකය :———.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න.
:———.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇත්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :———.

20. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................ මිය/මෙනෙවිය .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.

දිනය :———.

03-1111/2

## ශ්‍රී ලංකා පොලීසිය

### පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර

ශ්‍රී ලංකා පොලීසියේ ආධුනික පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2019.05.22 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

2016.01.01 වැනි දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි 11 වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 වැනි දින සිටය.

තවද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත. :

| | | |
|---|---|---|
| (*අ*) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (*ආ*) | රා. ප. ච. 03/2016 අනුව තනතුරට අදාළ 40% දීමනාව | රු. 10,595 0 |
| (*ඇ*) | දුෂ්කර දීමනාව | රු. 2,000 0 |
| (*ඈ*) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250 0 |
| (*ඉ*) | සංයුක්ත දීමනා (රු. 350 x 30 විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා) | රු. 10,500 0 |
| (*ඊ*) | සංයුක්ත දීමනා (රු. 350 x 24 විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා) | රු. 8,400 0 |

*මෙම දීමනාවලට අමතරව -*

(*අ*) නොමිලේ ගමන් පහසුකම්;

(*ආ*) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.);

(*ඇ*) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ;

(*ඈ*) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්;

(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 19 ත් 29 ත් අතර විය යුතු ය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :

- අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී විෂයන් 05ක් සමත් විය යුතුය. (විෂයයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය.)

*සටහන 01* : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් ලෙස ද, සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03* : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයක් ලෙස ගණනය කරනු නොලැබේ.

පහත සඳහන් සුදුසුකම් සපුරනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

* රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් පූර්ණ කාලීනව වසර 03ක මෝටර් කාර්මික පාඨමාලාවක් හදාරා තිබීම හා එම ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද.

(ඇ) *ශාරීරික සුදුසුකම්* :

- උස අඩි 05 යි. අඟල් 03 යි. (අවම),
- පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

*සටහන* : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා මූලික සුදුසුකම් ලබයි.

(ඈ) *වෘත්තීය සුදුසුකම්* :

(1) සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකය ලබා තිබීම.

(2) ඉහත බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් අවුරුදු 01ක මෝටර් රථ පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන*.-මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම, මෝටර් රථ අළුත්වැඩියාව පිළිබඳ පළපුරුද්ද, රිය පැදවීම දිගුකාලීන පළපුරුද්ද සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

❖ රිය පැදවීමේ දක්ෂතාව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන ශාරීරික අවයවයන් හැසිරවීමට බාධා ඇති කරන යම්කිසි අංගවිකලත්වයකින් හෝ වෙනත් ශාරීරික ආබාධයකින් පෙලෙන කිසියම් අපේක්ෂකයකු වෙතොත් එම අපේක්ෂකයා සේවයට සුදුසු බවට වෛද්‍ය සහතිකයක් ලබා තිබුණත්, ඔහු නුසුදුස්සෙකු වනු ඇත.

❖ මූලික සුදුසුකම් තිබෙන අයදුම්කරුවන්ගේ වාහන පැදවීම හා නඩත්තු කිරීමේ හැකියාව පිළිබඳ පරීක්‍ෂා කරනු ලැබේ. එමෙන්ම මාර්ග නීති, රථ වාහන සංඥා ක්‍රම පිළිබඳ අපේක්ෂකයන් ලබා ඇති දැනුමත්, එක් එක් අපේක්ෂකයා පැදවීමට නිපුනත්වය ලබා ඇති වාහනයෙහි යාන්ත්‍රික සිද්ධාන්තයන් පිළිබඳ මූලික දැනුමත් පරීක්‍ෂා කරනු ලැබේ.

(ඉ) *දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන්*.- එක් ඇසක දෘෂ්ඨිය 6/12 ට අඩු නොවිය යුතුය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එයද පිළගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතුය. යම් අයදුම්කරුවෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) *අනෙකුත් සුදුසුකම්* :

* අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.)

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තුදීමේ පරීක්ෂණය එනම් දරා ගැනීමේ ශක්තිය උරගාබැලීමේ පරීක්ෂණය සමත්විය යුතුය.

මීටර් 1000 - මිනිත්තු 03 තත්පර 44

❖ යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් වෘත්තීයමය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06. *වෘත්තීයමය සුදුසුකම් :*

6.1 වෘත්තීයමය පරීක්‍ෂණය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්‍ෂකගේ අධීක්‍ෂණය යටතේ පොලිස් රියදුරු පාසලේ සහකාර අධ්‍යක්‍ෂ විසිනි.

6.2 වෘත්තීයමය පරීක්‍ෂණය සඳහා ලකුණු 100 ක් වෙන් කර ඇත. මෙම වෘත්තීයමය පරීක්‍ෂණය පහත පරිදි සමන්විත වේ.

| | | |
|---|---|---|
| (අ) | රිය පැදවීමේ ප්‍රවීනතාවය | ලකුණු 50 |
| (ආ) | මාර්ග නීති උපදේශක සංග්‍රහය | ලකුණු 25 |
| (ඇ) | වාහන නඩත්තු කිරීම සහ සුළු අලුත්වැඩියාවන් පිළිබඳ දැනීම | ලකුණු 25 |

6.3 වෘත්තීයමය පරීක්‍ෂණය රිය පැදවීමේ ප්‍රවීනත්වය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 50න් අවම වශයෙන් ලකුණු 25ක් හා මාර්ග නීති උපදේශක සංග්‍රහය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් සහ වාහන නඩත්තු කිරීම හා සුළු අලුත්වැඩියාවන් සම්බන්ධ දැනුම සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් ද ලබාගෙන වෘත්තීයමය පරීක්‍ෂණය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු 100න් ලකුණු 50ක් අවම වශයෙන් ලබාගෙන ඇති අයදුම්කරුවන් වෘත්තීයමය පරීක්‍ෂණය සමත් වූ ලෙස සලකනු ලැබේ. වෘත්තීයමය පරීක්‍ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් වෛද්‍ය පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

*සටහන.*-බඳවා ගනු ලබන පොලිස් කොස්තාපල් රියදුරන් ආධුනික කාලය අවසන් වීමට ප්‍රථම බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකය ලබා ගෙන පොලිස් විද්‍යාලය මගින් පවත්වනු ලබන බර වාහන පැදවීමේ පරීක්‍ෂණයෙන් සමත් විය යුතුය.

07. *වෛද්‍ය පරීක්ෂණය :*

අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්‍ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්‍ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්‍ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. *පසුබිම් පරීක්ෂණය :*

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

09. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :*

- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්/නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

10. *පත්වීමේ කොන්දේසි :*

- මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

11. *සේවා කොන්දේසි :*

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙක්ම ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්‍ෂණවලින් සමත් විය යුතු ය. එම පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන්ට පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල් රියැදුරුවරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල් රියැදුරුවරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල් රියැදුරුවරුන් සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලිසියේ අනුමත උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

12\. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

13\. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ලේඛන ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,

(උ) රියැදුරු බලපත්‍රයෙහි ඡායා පිටපතක්.

14\. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

15\. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

2019 මාර්තු මස 05 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

| |
|---|
| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා<br><br>2" x 2 1/2" ප්‍රමාණය |

**ශ්‍රී ලංකා පොලීසිය**

***ආධුනික පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර***

*ආදර්ශ අයදුම්පත්‍රය*

01\. (අ) සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.

(ආ) නම (මුලකුරු සමග) :————.

(ඇ) අයදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කරු උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————. පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ලිපි හුවමාරු කළ යුතු ලිපිනය :————.
(ඊ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(උ) දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

06. (අ) ජන වර්ගය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වූයේ පරම්පරාවෙන් ද ? *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.
* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පාර්ශවයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (*ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට*)
අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————.

පපුව : අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් ඇමිණිය යුතුය) :————.

10. (අ) රියැදුරු බලපත්‍ර අංකය :————.
(ආ) රියැදුරු බලපත්‍රය ලබාගත් දිනය :————.
(ඇ) ප්‍රවීණතාවය ලබා ඇති වාහන පංතිය :————.
(රියැදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය)

11. අතිරේක සුදුසුකම් :————. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතු ය)

12. විවාහක/අවිවාහක බව :————.

13. (අ) දැනට කරන රැකියාව :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

14. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :————.

15. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

(අ) ————.

(ආ) ————.

16. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිසියේ සේවය කර තිබේ ද ? :————.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :————.

17. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

18. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

19. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

20. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇත් ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට

පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

21. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මයා .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයකු බවත් ඔහු මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.

දිනය :———.

03-1111/3

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2019

**2019/2021 අධ්‍යයන වර්ෂය සඳහා පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5, 6 මට්ටම ලබා ගැනීමට අපේක්ෂිතය)**

1. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා 2019/2021 අධ්‍යයන වර්ෂවලට කරඳගොල්ල හා සීප්පුකුලම ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2019 මැයි මස මහනුවර දී පවත්වනු ලබන අතර, ඒ සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමට ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලයේ පූර්ණකාලීන අවුරුදු දෙකක නේවාසික පුහුණුවෙන් පසු මාස 06ක රැකියාස්ථ පුහුණුවක් නම් කරන ලද ආයතන දෙකකින් ලබාගැනීම අනිවාර්ය වේ.

2. *ඩිප්ලෝමා පාඨමාලාව :*

2.1 මෙම පාඨමාලාව පූර්ණ ලෙස ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, අවිවාහක ගැහැණු පිරිමි දෙපක්ෂයටම විවෘත වේ.

2.2 මෙම පුහුණුව හුදෙක්ම වෘත්තිමය සුදුසුකම් ලබා දීමක් පමණක් වේ. රජයේ රැකියාවක් ලබා ගැනීම සඳහා මෙම වෘත්තීය සුදුසුකමට අමතරව, එම තනතුරට අදළ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් අනෙකුත් සුදුසුකම් ද සපුරා තිබීම අත්‍යවශ්‍ය වේ.

2.3 පාඨමාලාව හදාරන කාලය තුළ දී සිසුන්ට දෛනිකව නේවාසික දීමනාවක් ලබා දෙන අතර, අමතරව අවශ්‍ය වන මුදල් සිසුන් විසින් සපුරා ගත යුතුය.

2.4 සෙනසුරාදා හා ඉරිදා යන දිනවල ප්‍රායෝගික කටයුතු පැවැත්වෙන අතර, ඇතැම්විට දේශන ද පවත්වන බැවින් නේවාසිකාගාරවලින් බැහැර වීමට අවසර දෙනු ලබන්නේ මසකට එක් සති අන්තයක දී පමණි.

3. *ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :*

3.1 (*අ*) සිංහල භාෂාව හා සාහිත්‍යය/දෙමළ භාෂාව හා සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයයන් හතරට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව හා තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද සහිතව එකවර විෂයයන් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

සහ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් තුනම එක් වරකදී සමත් වී තිබීම.

හෝ

(*ආ*) සිංහල භාෂාව හා සාහිත්‍යය/දෙමළ භාෂාව හා සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයයන් හතරට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද සහිතව එකවර

විෂයයන් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

සහ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් හදරා විෂයයන් තුනම එක් වරක දී සමත් වී තිබීම.

හෝ

(ඇ) සිංහල භාෂාව හා සාහිත්‍යය/දෙමළ භාෂාව හා සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයයන් හතරට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද සහිතව එකවර විෂයයන් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.

සහ

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂයයන් හදරා එකවර විෂයයන් තුනක් සමත් වී තිබීම.

3.2 2019 අප්‍රේල් මස 22 වැනි දිනට අපේක්ෂකයාගේ වයස අවුරුදු 17ට නොඅඩු විය යුතු අතර අවු. 25ට වැඩි නොවිය යුතු අතර අවිවාහක විය යුතුය.

3.3 අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හෝ නියමිත වයස් සීමාවෙන් බැහැරවන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.4 ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයදුම්කරුවන් අයදුම්පත් එවීම නොකළ යුතුය.

04. *අයදුම්පත්* :

4.1 මෙම දැන්වීමේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පතක් පිළියෙල කරගත යුතුය.

4.2 විභාග ගාස්තුව රු. 150කි. අපේක්ෂකයා විසින් එම මුදල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පේරාදෙණිය, මහජන බැංකුවේ ගිණුම් අංක 057100179027275 වෙත බැර කර රිසිට්පතේ මුල් පිටපත අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය. රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීමට කටයුතු කරන්න. මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. එසේම මොනම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. විභාග ගාස්තු සඳහා වන බැංකු රිසිට්පත අයදුම්පත්‍රය සමග ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2019 අප්‍රේල් මස 22 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන), සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය.

4.4 අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "2019/2021 පාඨමාලාව සඳහා සත්ත්ව පාලන විද්‍යාලයට ඇතුළත්වීම" යන්න සඳහන් කරන්න.

4.5 අයදුම්පත්‍රයට අධ්‍යාපන සහතිකවල පිටපත් හා උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය. *ගැසට්* නිවේදනයේ සඳහන් ඉල්ලා ඇති සියලුම සුදුසුකම් නොමැති, නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් හා ඉල්ලා ඇති සහතිකපත්වල පිටපත් අමුණා නැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සියලුම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයෙ දී ඉදිරිපත් කළ යුතුවේ.

5. *බඳවා ගැනීම* :

5.1 පුහුණුවන්නන් තෝරාගනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් අනතුරුව සුදුසුකම් ලැබූ අය සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුවය.

5.2 ලිඛිත පරීක්ෂණය සඳහා විෂයය නිර්දේශය පහත පරිදි වේ. :

(i) සත්ත්ව පාලනය - අ.පො. ස සාමාන්‍ය පෙළ කෘෂිකර්ම විෂයය නිර්දේශයේ සත්ත්ව පාලන කොටසට අදාළව සකස්කරන බහුවරණ ප්‍රශ්න - කාලය පැය 01 යි.

(ii) සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි.

5.3 ලිඛිත පරීක්ෂණය හෝ සම්මුඛ පරීක්ෂණය හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් රජය මගින් ගෙවනු නොලැබේ.

5.4 විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී අයදුම්කරුවන් විසින් තම අනන්‍යතාවය විභාග ශාලාධිපති වෙත

සනාථ කර සිටිය යුතුය. මේ සඳහා පහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

5.5 යම් අයදුම්කරුවකු විසින් අසත්‍ය තොරතුරු සපයා ඇති බව තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඔහුගේ හෝ ඇයගේ ශිෂ්‍යභාවය වහාම අත්හිටුවනු ලැබීමට යටත්වනු ඇත. එලෙසම පුහුණු පාඨමාලාව ආරම්භ කර මසකට පසු ඉවත්ව යන සිසුන් පුහුණුව සඳහා රජය මගින් ඒ වන විට දරා ඇති සියලු වියදම දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට බැඳී සිටින්නේය. වියදම් ප්‍රමාණය තීරණය කිරීමේ අයිතිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවන්නේ ය.

06. සෑම අයදුම්කරුවකුම තම අත්සන රජයේ පාසැල් ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු රු. 498,960 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

07. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා නිවේදනය බලාත්මක විය යුතු වන්නේය.

වෛද්‍ය නිහාල් වෙදසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

2019 මාර්තු මස 07 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
ගැටඹේ, පේරාදෙණිය.

**ඉල්ලුම් පත්‍රය**

***සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව***

*ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලය*

පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (2019/2021)

විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යය: [ සිංහල ] [ දෙමළ ]
(අදාල කොටුවට කතිරයක් යොදන්න)

01. (i) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
උදා : (HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-
උදා : (GUNAWARDHANA H. M. S. K.)
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :-

02. ලිපිනය : ප්‍රවේශපත්‍ර එවීම සඳහා :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

04. දිස්ත්‍රික්කය :————.

05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

06. උපන් දිනය :- වර්ෂය : | | | | | මාසය | | | දිනය | | |

07. 2019.04.22 වැනි දිනට වයස :- අවුරුදු :————. මාස :————. දින :————.

08. දුරකථන අංකය :- | | | | | | | | | | |

09. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

10. ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් :-

(i) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය :

| විෂයයන් | සාමාන්‍ය/සම්මාන/ විශිෂ්ඨ | වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |
| 05. | | | |
| 06. | | | |
| 07. | | | |
| 08. | | | |
| 09. | | | |
| 10. | | | |

(ii) අ.පො.ස (උසස් පෙළ) විභාගය :

| විෂයයන් | සාමාන්‍ය/සම්මාන/ විශිෂ්ඨ | වර්ෂය | විභාග අංකය |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |

(අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුය. අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත)

11. මුදල් ගෙවූ බැංකු රිසිට්පත් අංකය :————.
(බැංකු රිසිට්පත ගලවා ගත හැකිවන පරිදි අමුණන්න)

12. අවසන් වරට අධ්‍යාපනය ලැබූ පාසල් / ආයතනය :————.

13. පාසලෙන් / ආයතනයෙන් අස්වූ දිනය :————.

14. සත්ත්ව පාලනය පිළිබඳ දැනට යම් පළපුරුද්දක් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

15. කෘෂිකාර්මික, සමාජ සේවා, ග්‍රාම සංවර්ධන / ක්‍රීඩා / පළපුරුද්ද :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුය.)

16. අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :

1. ————.

2. ————.

ඉහත දැක්වෙන විස්තර මාගේ දැනීමේ විශ්වාසයේ හැටියට සත්‍යවූද, නිවැරදි වූද තොරතුරු බව මාගේ සුපුරුදු අත්සන තබා මෙයින් සහතික කරන අතර, යම් ලෙසකින් මා මෙම පුහුණුවට තෝරාගත් පසු අසත්‍ය තොරතුරක් පිළිබඳ හෙලිදරව් වුවහොත්, මාගේ ශිෂ්‍යභාවය අත්හිටුවීමට හැකි බව ද, පුහුණුව ලබන කාලයේදී මා වෙනුවෙන් රජයට යම් මුදලක් ගෙවීමට සිදුවී නම්, එම මුදල ගෙවීමට ද මම බැඳී සිටින බව ද දන්වමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*සටහන* - මෙම අයදුම්පත සමග අමුණා ඉදිරිපත් කරන සහතික පිටපත් ලේඛන.

1. ————.
2. ————.

***අත්සන සහතික කිරීම***

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..........................................................මහතා / මහත්මිය / මෙනවිය මා ඉතා හොඳින් දන්නා හඳුනන අයෙකි. ඔහු / ඇය විසින් නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බවත්, ඔහු / ඇය ඉහත අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

03-1243

---

## ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (2019)

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්නා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සේවය කරනු ලබන, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන්ගේ පළමු කාර්යක්ෂමතා කඩඉම සඳහාවන විභාගය මෙම අමාත්‍යාංශය වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2019 ජූනි මස කොළඹ දී පවත්වනු ලැබේ. පහත සඳහන් නිවේදනයට අනුකූලව ඒ සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

02. විභාග පටිපාටිය

(අ) මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 03 කින් යුක්තවන අතර එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ විෂයය නිර්දේශය අංක 03 යටතේ දක්වා ඇත.

(ආ) විෂයය අංක 01 සිට 03 තෙක් එක් එක් විෂයය සඳහා මුළු ලකුණු ප්‍රමාණය 100 ක් බැගින්වන අතර, එක් එක් විෂයෙන් සමත්වීමේ අවම ලකුණු ප්‍රමාණය 40 කි.

(ඇ) මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඇ) ඉංග්‍රීසි විෂයට අදාළ ලිඛිත පරීක්ෂණයේ ලකුණු 75 න් 30 ක් ද, වාචික පරීක්ෂණයෙන් ලකුණු 25න් 10 ක් ද ලබා ගැනීම අවශ්‍ය වේ.

(ඉ) මෙම විභාගයට නියමිත විෂයයන් තුන සඳහා, එක් වතාවක දී හෝ කිහිපවතාවක දී හෝ පෙනී සිට සාමාර්ථ්‍ය ලැබිය හැකිය. එක් වතාවකදී ඉංග්‍රීසි ලිඛිත පරීක්ෂණය හෝ වාචික පරීක්ෂණය යන දෙකෙන් එක් පරීක්ෂණයක් පමණක් අසමත් නම් එම අසමත් පරීක්ෂණය සඳහා පමණක් ඊළඟ වතාවේ ඉල්ලුම් කළ හැකිය.

(ඊ) විභාග ගාස්තු :

පළමුවන වතාවට සම්පූර්ණ විභාගයට හෝ කොටසකට පෙනී සිටීමේ දී විභාග ගාස්තුවෙන් නිදහස් වේ. පළමුවන වතාව නොවන විට පහත සඳහන් පරිදි විභාග ගාස්තු අය කෙරේ.

සම්පූර්ණ විභාගය සඳහා රු. 500. 0
එක් විෂයයක් සඳහා රු. 200. 0

එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හෝ වෙත මුදලින් ගෙවා අයදුම්කරු නමින් ලබාගන්නා ලදුපත එහි එක් දාරයකින් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතුය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

03. ප්‍රශ්න පත්‍ර සහ එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශ :

පළමුවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 03)

01. මුදල් රෙගුලාසි (විෂය අංකය - 01)

i. ඒකාබද්ධ අරමුදල
ii. අයවැය වර්ගීකරණ ඒකක
iii. පුනරාවර්ථන වියදම්/ප්‍රාග්ධන වියදම්
iv. වීරමොං ක්‍රියා පටිපාටිය
v. ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අධීක්ෂණය
vi. ගණන්දීමේ නිලධාරීන් හා රාජ්‍ය ආදයම පිළිබඳ ගණන්දීමේ නිලධාරීන්
vii. ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම්
viii. රාජ්‍ය ආදයම පිළිබඳ ගණන්දීමේ නිලධාරීන්ගේ යුතුකම් හා වගකීම්
ix. භාණ්ඩාගාර අධීක්ෂණය හා පාලනය
x. දෙපාර්තමේන්තුවක් වශයෙන් භාණ්ඩාගාරය සතු විධායක කාර්යයන්
xi. අභ්‍යන්තර විගණනය
xii. මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරාදීම (අ. වියදම ආ. ආදයම)
xiii. විගණන විමසුම්
xiv. ගෙවීම් කාර්ය පටිපාටිය
xv. සමීක්ෂණ මණ්ඩල
xvi. සැපයුම් හා සේවා ලබාගැනීම පිළිබඳ කාර්යපටිපාටිය

දෙවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 03යි)

02. ආයතන හා කාර්යාල ක්‍රම - (විෂය අංකය 02)

ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩයෙහි පරිච්ඡේද අංක I, II, III, IV, VI, VII, VIII, XII, XIV, XV, XXII, XXIV, XXV, XXVII හා II වන කාණ්ඩයෙහි පරිච්ඡේද අංක XLVII සහ කාර්යාල ක්‍රම හා ක්ෂේත්‍ර සංවිධාන ක්‍රම පිළිබඳ දැනුම විමසා බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

තුන්වන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 03යි)

03. ඉංග්‍රීසි (විෂය අංකය 03)

(අ) ලිඛිත පරීක්ෂණය (විෂය අංකය 03 (i))
(ආ) වාචික පරීක්ෂණය (විෂය අංකය 03 (ii))

(1) Content

Written Examination (3 hours)
(a) Grammar : The following arias will be tested.

i. The verb forms of all principal tenses of English *eg* : The Present Simple Tense, The Simple Past, The Present Perfect, etc.
ii. Nouns, Countable, Un Countable
iii. Pronouns
iv. Adjectives Degrees of Comparison
v. Adverbs of Frequency, Word order, Phrases
vi. Prepositions
vii. Determiners
viii. Question words
ix. Model Auxiliaries, Can, Could, May, Might, Should, Must, Ought
x. The Definite Article
xi. Cardinals/Ordinals
xii. The Passive Construction
xiii. Relative Clauses
xiv. If Clauses
xv. Reported Speech
xvi. There is/There are
xvii. Have/Has

(b) Vocabulary tested will be that of General Modern English with special emphasis on the following field of Management Administration and Social and Economic Development

(c) Writing - Ability to write Essays, Department Reports, Official Letters
Oral Examination (15 Minutes)
i. Speech
ii. Listening Comprehension
iii. Reading

(2) Scheme of Examination
(1) Written Examination - There will be one paper of 3hrs duration (75% marks)
(2) Oral Examination - 5 Minutes duration (25% Marks)

04. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(*අ*) මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව ඉල්ලුම් පත්‍රය ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ පිළියෙල කර ගත යුතුය. ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක (1) සිට (3) තෙක් පළමුවන පිටුවටද, ඉතිරිය දෙවන පිටුවට ද ඇතුළත් විය යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල විය යුතු වන අතර, එසේ නොවන ඉල්ලුම් පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2019.04.22 වේ. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් 2019.04.22 දිනට පෙර ලැබෙන ලෙස පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503, කොළඹ.

(*ඇ*) ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ ඉහළ වමත් පස ''ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 (2019)'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාර ගනු නොලැබේ.

(*ඈ*) ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් තම ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කිරීම සුදුසු වේ. (එසේ විමසීමේදී අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීම සඳහා, ඔබ ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද සූදානම් කර තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.)

(*ඉ*) ඉල්ලුම් පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය.

05. *විභාගයට පෙනී සිටීම* :

(*අ*) නිවේදනයේ සඳහන් ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය, අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග ශාලාධිපතිට, අත්සන සහතික කරවා ගත් තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

*සටහන*.- සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කර තිබීම විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන්

යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

(ආ) *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය .-* තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතා සහතිකවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු රියදුරු බලපත්‍රය.

06. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව අවසන් තීරණය ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

07. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

වී. සිවඥානසෝති,
ලේකම්.

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය.

2019 මාර්තු මස 12 වැනි දින,
අංක 15/ඒ,
ඇල්ෆ්‍රඩ් පෙදෙස,
කොළඹ 03.

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය, පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ යෞවන කටයුතු අංශයේ දී.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි).

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (2019)

First Efficiency Bar Examination for Entrepreneurs Development Training Officers of the Small Enterprises Development Division of the Ministry of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development, Vocational Training and Skills Development and Youth Affairs - 2018 (2019)

විභාගයට පෙනී සිටින මාධ්‍යය :- [ ]

සිංහල - 2/දෙමළ -3 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————————————.
උදාහරණය : GUNAWARDANA, M. G. B. S. K.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02.

2.1 රාජකාරි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(මෙම ලිපිනයට ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.)

2.2 ස්ථිර ලිපිනය : (සිංහලෙන්) :————.

2.3 ස්ත්‍රී/පුරුෂ භාවය :

(ස්ත්‍රී - 1 පුරුෂ -0) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.4 ජංගම දුරකථන අංකය :

03. විභාගයට පෙනී සිටින විෂයයන් :

1. ........................ විෂයය අංකය

2. ........................ විෂයය අංකය

3. ........................ විෂයය අංකය

04. විභාගයට පෙනී සිටි වාර ගණන :————.

05. විභාග ගාස්තු :

(i) ගෙවන ලද ගාස්තුව රු. :————. (ii) ගෙවූ කාර්යාලය :————.

(iii) ගෙවූ දිනය :————. (iv) ලදුපත් අංකය :————.

| |
|---|
| *ගැසට්* නිවේදනයේ අංක 02 (ඊ) ඡේදය අනුව, විභාග ගාස්තු ගෙවූයේ නම් එම ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අත්‍යවශ්‍ය වනු ඇත. |

ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ........................ මයා/මිය/මෙනෙවිය, මා ඉදිරියේදී අත්සන් තැබූ බව ද ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව ද අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බව ද සහතික කරමි. තව ද, ඔහු/ඇය පළමු වතාවට මෙම විභාගය සඳහා පෙනී සිටින බවද/විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.

03-1312/1

**ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018(2019)**

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්නා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සේවය කරනු ලබන, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන්ගේ දෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා වන විභාගය මෙම අමාත්‍යාංශය වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2019 ජූනි මස කොළඹ දී පවත්වන බැවින් සුදුසුකම් ලැබූ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් වෙතින් පහත සඳහන් නිවේදනයට අනුකූලව ඒ සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

02. *විභාග පරිපාටිය* :

(*අ*) මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වන අතර එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ විෂයය නිර්දේශය අංක 03 යටතේ දක්වා ඇත.

(*ආ*) විෂයය අංක 01 සිට 02 තෙක් එක් එක් විෂයය සඳහා මුළු ලකුණු ප්‍රමාණය 100 ක් බැගින් වන අතර, එක් එක් විෂයෙන් සමත්වීමේ අවම ලකුණු ප්‍රමාණය 40 කි.

(*ඇ*) මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(*ඈ*) මෙම විභාගයට නියමිත විෂයන් දෙක සඳහා, එක් වතාවක දී හෝ කිහිප වතාවක දී හෝ පෙනී සිට සාමර්ථ්‍ය ලැබිය හැකිය.

(*ඉ*) විභාග ගාස්තු :

පළමුවන වතාවට සම්පූර්ණ විභාගයට හෝ කොටසකට පෙනී සිටීමේදී විභාග ගාස්තුවෙන් නිදහස් වේ.
පළමුවන වතාව නොවන විට පහත සඳහන් පරිදි විභාග ගාස්තු අය කෙරේ. :

| | |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | රු. 500 0 |
| එක් විෂයයක් සඳහා | රු. 200 0 |

එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හෝ වෙත මුදලින් ගෙවා අයදුම්කරු නමින් ලබාගන්නා ලදුපත එහි එක් දාරයකින් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතුය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

03. ප්‍රශ්න පත්‍ර සහ එක් එක් ප්‍රශ්න පත්‍රයට අදාළ විෂයය නිර්දේශය :

**පළමුවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 03)**

01. නීතිය හා කළමණාකරනය (විෂයය අංකය - 01)

I. නීතිය :

- නීතිය පිළිබඳ නිර්වචනය
- ශ්‍රී ලංකාවේ නීති පද්ධති
- ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධති
- සමාගම් ලියාපදිංචිය
- ව්‍යාපාර නාම ලියාපදිංචිය
- පේටන්ට් බලපත්‍ර
- ආදායම් බදු
- කම්කරු නීති රීති
- පාරිසරික නීති
- පාරිභෝගික ආරක්ෂක පනත
- සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල
- පළාත් පාලන ආයතන මගින් පනවන නීතිරීති

II. කළමනාකරණය :

- කළමනාකරණය පිළිබඳ හැඳින්වීම
- කළමනාකරුවන්ගේ කාර්යන් හා දක්ෂතා
- සැළසුම් ක්‍රියාවලිය හා සංවිධාන මට්ටම් ඇති කිරීම
- සංවිධාන ව්‍යුහය
- කාර්ය සාධන ඇගයීම්
- අභිප්‍රේරණය
- නායකත්වය
- සන්නිවේදනය
- තීරණ ගැනීම
- ඵලදායිතාව හා ඵලදායිතා කව
- කළමනාකරණ ආචාර ධර්ම හා වගකීම්
- බැංකු ක්‍රම
- රක්ෂණය

**දෙවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 03යි)**

02. තොරතුරු තාක්ෂණ හැකියාව (විෂයය අංකය 02)

(i) තොරතුරු තාක්ෂණ පිළිබඳ මූලික සංකල්ප
(ii) වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය
(iii) ගොනු කළමනාකරණය
(iv) අන්තර්ජාලය
(v) විද්‍යුත් තැපෑල

04. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(*අ*) මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව ඉල්ලුම් පත්‍රය ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ පිළියෙල කර ගත යුතුය. ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක (1) සිට (3) තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද ඇතුළත් විය යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල විය යුතු වන අතර, එසේ නොවන ඉල්ලුම් පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

(*ආ*) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනය 2019.04.22 වේ. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් 2019.04.22 දිනට පෙර ලැබෙන ලෙස පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

(*ඇ*) ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ ඉහළ වමත් පස ''ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2018 (2019)'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාර ගනු නොලැබේ.

(*ඈ*) ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් තම ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කිරීම සුදුසු වේ. (එසේ විමසීමේ දී අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීම සඳහා, ඔබ ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද සූදානම් කර තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.)

(*ඉ*) ඉල්ලුම් පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

05. *විභාගයට පෙනී සිටීම* :

(*අ*) නිවේදනයේ සඳහන් ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය, අයදුම්කරුගේ අත්සන හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග ශාලාධිපතිට, අත්සන සහතික කරවා ගත් තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

*සටහන.- ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කර තිබීම විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

(*ආ*) *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය.-* තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතා සහතික වලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු රියදුරු බලපත්‍රය.

06. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව අවසන් තීරණය ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා

පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු වේ.

07. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

වී. සිවඥානසෝති,
ලේකම්.

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය.

2019 මාර්තු මස 12 වැනි දින,
අංක 15/ඒ,
ඇල්ෆ්‍රඩ් පෙදෙස,
කොළඹ 03.

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය, පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ යෞවන කටයුතු අංශයේ දී

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (2019)

Second Efficiency Bar Examination for Entrepreneurs Development Training Officers in the Small Enterprises Development Division of the Ministry of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development, Vocational Training and Skills Development and Youth Affairs - 2018 (2019)

විභාගයට පෙනී සිටින මාධ්‍යය :-

සිංහල - 2/දෙමළ -3 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. නම
   1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
   උදාහරණය : GUNAWARDANA, M. G. B. S. K.
   1.2 සම්පූර්ණ නම :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   1.3 සම්පූර්ණ නම :————.
   (සිංහලෙන්)

   1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

02.
   2.1 රාජකාරි ලිපිනය :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   (මෙම ලිපිනයට ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.)

2.2 ස්ථිර ලිපිනය : (සිංහලෙන්) :————.

2.3 ස්ත්‍රී/පුරුෂ භාවය :
(ස්ත්‍රී - 1 පුරුෂ -0) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.4 ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

03. විභාගයට පෙනී සිටින විෂයයන්

1. ........................ විෂය අංකය [ ]

2. ........................ විෂය අංකය [ ]

04. විභාගයට පෙනී සිටි වාර ගණන :————.

05. විභාග ගාස්තු :

(i) ගෙවන ලද ගාස්තුව රු. :————. (ii) ගෙවූ කාර්යාලය :————.
(iii) ගෙවූ දිනය :————. (iv) ලදුපත් අංකය :————.

| |
|---|
| *ගැසට්* නිවේදනයේ අංක 02 (ඉ) ඡේදය අනුව, විභාග ගාස්තු ගෙවූයේ නම් එම ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අත්‍යවශ්‍ය වනු ඇත. |

ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන .......................... මයා/මිය/මෙනෙවිය, මා ඉදිරියේ දී අත්සන් තැබූ බව ද ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව ද, අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බව ද සහතික කරමි. තව ද, ඔහු/ඇය පළමු වතාවට මෙම විභාගය සඳහා පෙනී සිටින බව ද/විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.

03-1312/2

සංශෝධනයයි

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව**

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරීන් විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම**

2019.03.15 දින පළ කරන ලද අංක 2115 දරන *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 03-1236 දරන නිවේදනයේ ආදර්ශ අයදුම් පත්‍රයේ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය කොටසෙහි ''අධි ශ්‍රේණියට උසස් කිරීම'' යන කොටස ''විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම'' යනුවෙන් සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වමි.

ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

03-1544

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.